ආරක්ෂක අමාත්‍යාංශය
பாதுகாப்பு அமைச்சு
**MINISTRY OF DEFENCE**

ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය
தேசிய அனர்த்த நிவாரண சேவைகள் நிலையம்
National Disaster Relief Services Centre
විද්‍යා මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව
வித்யா மாவத்தை, கொழும்பு 07, இலங்கை
Vidya Mawatha, Colombo 07, Sri Lanka

දු.අ. / தொ.எ / T.N. 0112665258
ෆැක්ස් / பெக்ஸ் / Fax 0112665702
වි.තැ. / மி.அ.மு. / Email sahana.ndrsc@gmail.com

මගේ අංකය / எனது இல / My No. NDRSC/02/04/10

ඔබේ අංකය / உமது இல / Your No.

දිනය / திகதி / Date 2026.02.05

සියලුම දිස්ත්‍රික් ලේකම්වරු,
සියලුම ප්‍රාදේශීය ලේකම්වරු,

**<u>ආපදා බලපෑම හේතුවෙන් හානි වූ නිවාස ඉදිකිරීම සහ නායයෑම් අධි අවධානම් නිවාස වෙනුවෙන් දීමනා ගෙවීම හා ආපදා බලපෑම හේතුවෙන් ඇණහිට ඇති ව්‍යාපාර වෙත දීමනා ගෙවීම</u>**

“දිට්වා සුළි කුණාටුව” හේතුවෙන් පැන නැගුණු හදිසි ආපදා තත්ත්වය හේතුවෙන් බලපෑමට ලක්වූ ප්‍රදේශවල බිඳ වැටී ඇති ජන ජීවිතය යථා තත්ත්වයට පත් කිරීම සඳහා සහන ලබාදීමට අදාල උපදෙස් සහ පැහැදිලි කිරීම් ලබාදීම සඳහා අංක 02/04/10 හා 2026.01.06 දිනැතිව නිකුත් කරන ලද නිවාස වෙනුවෙන් දීමනා ගෙවීමේ මාර්ගෝපදේශය, 2026.01.14 දිනැතිව නිකුත් කරන ලද නිවාස වෙනුවෙන් දීමනා ගෙවීමට අදාළ මාර්ගෝපදේශයේ සංශෝධනය හා 2026.01.30 දිනැති ව්‍යාපාර වෙත දීමනා ගෙවීමට අදාළ මාර්ගෝපදේශය බැඳේ.

**02.** ඒ අනුව, නිවාස හානි වෙනුවෙන් දීමනා ලබාගැනීමට හා ව්‍යාපාර හානි වෙනුවෙන් දීමනා ලබාගැනීමට අදාළව ප්‍රතිලාභියා විසින් අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමේදී අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතු දිවුරුම් ප්‍රකාශය මේ සමඟ ඔබ වෙත යොමු කරන අතර අවශ්‍යතාවය පරිදි නිවාස හානි වන්දි ලබාගැනීමේ දී මෙම දිවුරුම් ප්‍රකාශය ද සම්පූර්ණ කර යොමු කරන මෙන් ප්‍රතිලාභීන් දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වමි.

කේ.ජී. ධර්මතිලක
අතිරේක ලේකම්
ආපදා කළමනාකරණ අංශය
ලේකම් වෙනුවට
ආරක්ෂක අමාත්‍යාංශය

CamScanner

## දිවුරුම් ප්‍රකාශයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ........................................ ස්ථානයේ පදිංචි........................................වන මම බෞද්ධාගමිකයකු / කතෝලික භක්තිකයෙකු වශයෙන් අවංකවත් සත්‍ය ලෙසත් ගරු ගාම්භීරතා පූර්වකවත් ප්‍රතිඥා දී / දිවුරුම් දී ප්‍රකාශ කර සිටින වගනම්,

1. ඉහත නම් සඳහන් ප්‍රතිඥාකරු/දිවුරුම් ප්‍රකාශක මම වෙමි.

2. මම පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද අංක.........................දරන සහ.................................දිනැති ජාතික හැඳුනුම්පතේ හිමිකරු වෙ.

3. දිට්වා සුළි කුණාටුව හේතුවෙන් ආපදාවට ලක් වූ .............................................................................. ලිපිනයේ පිහිටි ව්‍යාපාරික ගොඩනැගිල්ලේ නිරවුල් අයිතිය මා සතු බව ප්‍රකාශ කර සිටිමි.

4. මාගේ දැනීම අනුව ව්‍යාපාරික ගොඩනැගිල්ල ඉදිකිරීමේදී ලබා ගත යුතු සියලු අනුමැතින්ට යටත්ව ගොඩනැගිල්ල ඉදිකර ඇති බව ප්‍රකාශ කර සිටිමි. තවද, ව්‍යාපාරික ගොඩනැගිල්ල නිසි ලෙස අනුමැතින්ට යටත්ව ඉදිකර ඇති බැවින් සහ නාය යෑමේ අවදානමක් නොමැති බව පැහැදිලිව නිරීක්ෂණය වන බැවින් වන්දි ලබා ගන්නා ව්‍යාපාරික ගොඩනැගිල්ල නාය යෑමේ අවධානමක් පවතින බවට තහවුරු කර ගැනීමේ ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශ ලබා ගැනීම අවශ්‍ය නොවන බව ස්වාධීන කැමැත්ත මත ප්‍රකාශ කර සිටිමි.

5. දිට්වා සුළි කුණාටුව හේතුවෙන් මාගේ ගොඩනැගිල්ලට අලාභ වූ බව මම ප්‍රකාශ කර සිටින අතර හානි වී ඇති ව්‍යාපාරික ස්ථානය නැවත යථාවත් කර ගැනීම වෙනුවෙන් හානි තක්සේරුවකින් තොරව රු.500,000/- ක වන්දි ලබාගැනීමට කැමැත්ත ප්‍රකාශ කර සිටිමි. මෙම මුදල භාවිතයෙන් මාගේ ව්‍යාපාරික ගොඩනැගිල්ල පෙර තිබූ තත්ත්වයට හෝ පෙර තිබූ තත්ත්වයට වඩා උසස් තත්ත්වයකට හා ආපදා ප්‍රත්‍යස්ථික ගොඩනැගිල්ලක් ලෙස ඉදිකිරීමට/ප්‍රතිසංස්කරණය කිරීමට කැමැත්ත ප්‍රකාශ කර සිටිමි. තවද, මෙම මුදලට අමතරව වෙනත් කිසිදු මුදලක් මෙම කරුණට අදාළව රජයෙන් අපේක්ෂා නොකරමි.

6. මාගේ ව්‍යාපාරික ගොඩනැගිල්ල පිහිටි ඉඩම රජයේ ඉඩමක්, රක්ෂිතයක් හෝ වෙනත් කවර ආකාරයේ හෝ රජයේ අයිතිවාසිකම් කියන ඉඩමක් නොවන බව ප්‍රකාශ කර සිටින අතර කිසියම් හෝ කරුණක් මත එවැනි ඉඩමක් බවට තහවුරු වුවහොත් රජයෙන් ලබාදුන් මුදල් නැවත ලබාදීමට එකඟ වන බව ප්‍රකාශ කර සිටිමි.

7. මෙම දිවුරුම් ප්‍රකාශය මගින් හෝ වන්දි ලබා ගැනීමේ කාරණයට අදාළ කිසියම් හෝ කරුණකදී අසත්‍යය තොරතුරු ඉදිරිපත් කර නොමැති බව ප්‍රකාශ කර සිටින අතර අසත්‍ය තොරතුරු ඉදිරිපත් කර දිට්වා සුළි කුණාටුව හේතුවෙන් මාගේ ව්‍යාපාරික ස්ථානයේ හානියට අදාළව ආපදා වන්දි ලබාගෙන ඇත්නම් එම වන්දි නැවත රජයට අයකර ගැනීමට හා වෙනත් නෛතික ක්‍රියාමාර්ග මට විරුද්ධව ගත හැකි බව මා විසින් දන්නා බව ප්‍රකාශ කර සිටිමි.

ඉහත කරුණු සියල්ල සත්‍ය හා නිවැරදි බවට දිවුරා ප්‍රතිඥා දී ප්‍රකාශ කර සිටිමි.

ඉහත නම සඳහන් දිවුරුම් ප්‍රකාශක හට
ඉහත දිවුරුම් ප්‍රකාශය කියවා තේරුම් කර
දීමෙන් අනතුරුව සත්‍ය බවට පිළිගෙන
ප්‍රතිඥා දී අත්සන් කරන්නට
යෙදුණේ......................ක්වූ.... ..................මස
................දින.....................දීය.

මා ඉදිරිපිටදීය

සමාදාන විනිසුරු / දිවුරුම් කොමසාරිස්

CamScanner

# දිවුරුම් ප්‍රකාශයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ..........................................ස්ථානයේ පදිංචි..........................................වන මම බෞද්ධාගමිකයකු/කතෝලික භක්තිකයෙකු වශයෙන් අවංකවත් සත්‍ය ලෙසත් ගරු ගාම්භීරතා පූර්වකවත් ප්‍රතිඥාදී/දිවුරුම්දී ප්‍රකාශ කර සිටින වගනම්,

1. ඉහත නම් සඳහන් ප්‍රතිඥාකරු/දිවුරුම් ප්‍රකාශක මම වෙමි.

2. ඉහත නම් සඳහන් මම පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද අංක..........................දරණ සහ..................................දිනැති ජාතික හැඳුනුම්පතේ හිමිකරු වේ.

3. මාගේ නිවසේ හා නිවස පිහිටි ඉඩමේ නිරවුල් අයිතිය මා සතු බව ප්‍රකාශ කර සිටිමි.

4. මාගේ දැනීම අනුව නිවස ඉදිකිරීමේදී ලබා ගත යුතු සියලු අනුමැතින්ට යටත්ව මාගේ නිවස ඉදිකර ඇති බව ප්‍රකාශ කර සිටිමි. තවද, නිවස නිසි ලෙස අනුමැතීන්ට යටත්ව ඉදිකර ඇති බැවින් සහ නාය යෑමේ අවදානමක් නොමැති බව පැහැදිලිව නිරීක්ෂණය වන බැවින් වන්දි ලබා ගන්නා නිවස නාය යෑමේ අවධානමක් පවතින බවට තහවුරු කර ගැනීමේ ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශ ලබා ගැනීම අවශ්‍ය නොවන බව ස්වාධීන කැමැත්ත මත ප්‍රකාශ කර සිටිමි.

5. දිට්වා සුළි කුණාටුව හේතුවෙන් මාගේ නිවස හානියට පත් වූ බවත් නිවස යථාවත් කිරීම වෙනුවෙන් හානි තක්සේරුවකින් තොරව ලබාදෙනු ලබන රු. 500,000/-ක වන්දි මුදල ලබාගැනීමටත් මෙම මුදල භාවිතයෙන් මාගේ හානියට පත් නිවස පෙර තිබූ තත්ත්වයට හෝ පෙර තිබූ තත්ත්වයට වඩා උසස් තත්ත්වයකට හා ආපදා ප්‍රත්‍යස්ථිකව ඉදි කිරීමට/ප්‍රතිසංස්කරණය කිරීමටත් කැමැත්ත ප්‍රකාශ කර සිටිමි.

7. මාගේ නිවස සහ නිවස පිහිටි ඉඩම රජයේ ඉඩමක්, රක්ෂිතයක් හෝ වෙනත් කවර ආකාරයේ හෝ රජයේ අයිතිවාසිකම් කියන ඉඩමක් නොවන බව ප්‍රකාශ කර සිටින අතර කිසියම් හෝ කරුණක් මත එවැනි ඉඩමක් බවට තහවුරු වුවහොත් රජයෙන් ලබාදුන් මුදල් නැවත ලබාදීමට එකඟ වන බවත් ප්‍රකාශ කර සිටිමි.

6. මෙම දිවුරුම් ප්‍රකාශය මඟින් හෝ වන්දි ලබා ගැනීමේ කාරණයට අදාළ කිසියම් හෝ කරුණකදී අසත්‍යය තොරතුරු ඉදිරිපත් කර නොමැති බව ප්‍රකාශ කර සිටින අතර සත්‍ය නොවන තොරතුරු ඉදිරිපත් කර දිට්වා සුළි කුණාටුවට අදාළව ආපදා වන්දි ලබාගෙන ඇත්නම් එම වන්දි නැවත රජයට අයකර ගැනීමට හා වෙනත් නෛතික ක්‍රියාමාර්ග ගත හැකි බව මා දන්නා බව ප්‍රකාශ කර සිටිමි.

ඉහත කරුණු සියල්ල සත්‍ය හා නිවැරදි බව දිවුරා /ප්‍රතිඥා දී ප්‍රකාශ කර සිටිමි.

ඉහත නම සඳහන් දිවුරුම් ප්‍රකාශක හට ඉහත දිවුරුම් ප්‍රකාශය කියවා තේරුම් කර දීමෙන් අනතුරුව සත්‍ය බවට පිළිගෙන ප්‍රතිඥා/දිවුරුම් දී අත්සන් කරන්නට යෙදුණේ.....................ක්වූ...............මස .... ................දින.....................දීය.

මා ඉදිරිපිටදීය

සමාදාන විනිසුරු/දිවුරුම් කොමසාරිස්

CamScanner